රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
அரச கணக்குகள் திணைக்களம்
Department of State Accounts

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2014.12.24

රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක :- 238/2014 (i)

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

**2014 මුදල් වර්ෂය සඳහා වූ ගිණුම් පියවීම.**

ජනාධිපතිවරණ රාජකාරි කටයුතු සඳහා ආයතනවලට පැවරී ඇති කාර්යභාරය සැලකිල්ලට ගෙන 2014 මුදල් වර්ෂයේ ගිණුම් පියවීම සඳහා වන 2014.11.04 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 238/2014 හි 3.2 සිට 3.6 දක්වා ඡේදවල සඳහන් දිනයන් පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

| අනු අංක | කාර්යය | කාර්යය සම්බන්ධ පැහැදිලි කිරීම් | කාර්යය නිම කළ යුතු නිශ්චිත අවසාන දිනයන් |
|---|---|---|---|
| 3.2 | **2014 දෙසැම්බර් මාසයේ ගණුදෙනු ඇතුලත් පළමු ගිණුම් සාරාංශය ඉදිරිපත් කිරීම.** | 2014 දෙසැම්බර් 31 දක්වා කරන ලද සියලු ගනුදෙනු ඇතුළත්ව පළමු ගිණුම් සාරාංශය ඉදිරිපත් කළ යුතු ය. | **232/2013 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුව**<br>**(i) පළමු උපලේඛණයේ සඳහන් ආයතන 2015 ජනවාරි 16 ට පෙර**<br>**(ii) දෙවන උපලේඛණයේ සඳහන් ආයතන 2015 ජනවාරි 20 ට පෙර** |



මහ භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව பொது திறைசேரி, கொழும்பு 01, இலங்கை. General Treasury, Colombo 01, Sri Lanka. General - Tel.: +94 112 484600 Website: www.sad.gov.lk
Director General - Tel.: +94 112 484728 Fax: +94 112 473856 e-mail: dgsa@sad.treasury.gov.lk Additional Director General - Tel.: +94 112 484898
Director (Accounting & Reporting): +94 112 484747 Director (Accounting Services): +94 112 484753 Director (Systems & Training): +94 112 484733

| | | | |
|---|---|---|---|
| 3.3 | **2014 වර්ෂයේ දෙසැම්බර් මස භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශය නිකුත් කිරීම.** | 2014 දෙසැම්බර් මස පළමු ගිණුම් සාරාංශයේ අන්තර්ගත ගනුදෙනු ඇතුළත් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ භාණ්ඩාගාර වෙබ් අඩවිය වන **http/www.treasury.gov.lk** වෙත මුදාහරිනු ලැබේ. මෙමගින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ වෙබ් පිටුවට පිවිස පළමු භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශය ලබාගත යුතු ය. | **2015 ජනවාරි 22 ට පෙර** |
| 3.4 | **පළමු පරිපූරක ගිණුම් සාරාංශය ඉදිරිපත් කිරීම.** | 2014 වර්ෂයේ දෙසැම්බර් මාසයේ පළමු ගිණුම් සාරාංශයේ ඇතුළත් කිරීමට නොහැකි වූ ගණුදෙනු පමණක් ඇතුළත් කර **"පළමු පරිපූරක ගිණුම් සාරාංශය"** ඉදිරිපත් කළ යුතු ය. මෙහිදී CIGAS වැඩසටහනෙහි 2014 දෙසැම්බර් මාසය සඳහා වූ මාසික ගිණුම් වැසීම (Month end process) සම්පූර්ණ කිරීමෙන් පසු පමණක් පළමු පරිපූරක ගිණුම් සාරාංශය ඉදිරිපත් කිරීම සිදු කළ යුතු ය. | **2015 ජනවාරි 26 දින හෝ ඊට පෙර** |
| 3.5 | **පළමු පරිපූරක ගිණුම් සාරාංශය ද ඇතුළත් පළමු භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශය නිකුත් කිරීම.** | 2014 දෙසැම්බර් පළමු ගිණුම් සාරාංශයෙන් සහ පළමු පරිපූරක ගිණුම් සාරාංශයෙන් වාර්තා කරන ලද සියලු ලැබීම් හා ගෙවීම් හා වැරදි නිවැරදි කිරීම් ඇතුළත් පළමු පරිපූරක භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශය භාණ්ඩාගාර වෙබ් අඩවිය වන **http/www.treasury.gov.lk** වෙත මුදාහරිනු ලැබේ. මෙමගින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ වෙබ් පිටුවට පිවිස පළමු පරිපූරක භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශය ලබාගත හැකිය. | **2015 ජනවාරි 28 දින හෝ ඊට පෙර** |

| | | | |
|---|---|---|---|
| 3.6 | **දෙවන හා අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ නිකුත් කිරීමට පෙර මූ.රෙ. 69 අයදුම් පත්‍ර ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.** | මෙවැනි අයදුම්පත් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතියෙන් පසු රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට යොමු කරනු ලැබේ. | **2015 පෙබරවාරි 02 දින හෝ ඊට පෙර** |

එසේම, රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 238/2014 හි සඳහන් අනෙකුත් කරුණු සහ දිනයන් නොවෙනස්ව පවතී.

ඩී.එම්.ඒ. හරස්ගම
රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙනුවට

පිටපත්:

1. මැතිවරණ කොමසාරිස්
2. විගණකාධිපති
3. අධ්‍යක්ෂ ජනරාල් - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
4. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අයවැය දෙපාර්තමේන්තුව
5. අධ්‍යක්ෂ - ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකා මහ බැංකුව